# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1553/31 - 2008 ජුනි 13 වැනි සිකුරාදා - 2008.06.13

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. බී. 21/78.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

27 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 වන වගන්තියේ (1) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර උසස් අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය වටරැක ආරච්චිලාගේ විශ්වා වර්ණපාල වන මා විසින් එකී පනතේ 21 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ සබරගමුව විශ්වවිද්‍යාලයට අදාළව සාදන ලද 1995 නොවැම්බර් මස 07 වන දින අංක 896/2 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද සහ 2007 ඔක්තෝබර් මස 18 වන දින අංක 1519/26 දරන රජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත නියමයේ උපලේඛනය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත කරනු ලබන මේ නියමයෙන්, එම උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන " කළමනාකරණ අධ්‍යයන පීඨය " යන අයිතමය සහ ඊට අනුරූපීව එහි II වන තීරයේ දැක්වෙන සටහන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීම මගින් මෙයින් සංශෝධනය කරමි.

| "*I වන තීරය* පීඨය | *II වන තීරය* දෙපාර්තමේන්තුව |
|---|---|
| කළමනාකරණ අධ්‍යයන පීඨය | 1. ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයන අංශය<br>2. ගණකාධිකරණ හා මූල්‍ය අධ්‍යයන අංශය<br>3. සංචාරක කළමනාකරණ අධ්‍යයන අංශය<br>4. අලෙවි කළමනාකරණ අධ්‍යයන අංශය" |

මහාචාර්ය වටරැක ආරච්චිලාගේ විශ්වා වර්ණපාල,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2008 ජුනි මස 09 වැනි දින,
කොළඹ දී ය.
06-601

1A - G 009865- 935 (2008/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.